**2024-01-01 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම (SLTFTA)**

යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ 9 වැනි සාකච්ඡා වටය 2023-12-18 දින සිට 2023-12-20 දින දක්වා කොළඹදී පවත්වා ඇත. මේ වන විට අදාළ සාකච්ඡා අවසන් කර ඇති අතර නෛතික හා ආයතනික ගැටලු පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායම වෙත නීතිමය පිරික්සීම සඳහා යොමු කර තිබේ. මෙම ගිවිසුම යටතේ තීරුබදු ලිහිල්කරණ වැඩසටහනෙහි සංවේදී ලැයිස්තුවේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක මත අදාළ වන සමුච්චිත තීරුබදුවලින් 50%ක්, ගිවිසුම බලාත්මක වූ දින සිට 16 වන වසර ආරම්භයේදී එකවර ඉවත් කිරීමට හැකි වන පරිදි විධිවිධාන ඇතුළත් කිරීමටත්, ඒ අනුව තීරුබදු ලිහිල්කරණ වැඩසටහනෙහි කාලසීමාව වසර 18 සිට වසර 16 දක්වා අඩු කිරීමටත් 9 වැනි සාකච්ඡාවේදී දෙපාර්ශ්වය විසින් එකඟ වී ඇත. එකී එකඟතාව පරිදි ඉදිරි කටයුතු කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. කෘෂිකර්ම අංශ නවීකරණ වැඩසටහන**

ඌන උපයෝජිත සම්පත් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තුළ කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යොදා ගනිමින් රටේ නිෂ්පාදිත ඵලදායිතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ගොවීන්ගේ ආදායම හා ඵලදායිතාව ඉහළ නැංවීම, වෙළෙඳපොළ නියාමනය, අපනයනය ඉලක්ක කර ගත් නිෂ්පාදන වැඩි කිරීම, තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තයට ආකර්ෂණය කර ගැනීම තුළින් කෘෂි ව්‍යවසායකයින් බිහි කිරීම සහ තොරතුරු තාක්ෂණය කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා යොදා ගැනීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස කෘෂිකාර්මික අංශය කඩිනමින් නවීකරණය කළ යුතුව තිබේ. කෘෂිකාර්මික අංශ නවීකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් පියවරයන් සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් සිය එකඟතාව ලබා දෙන ලදී:

* 2048 වර්ෂය වන විට සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ කාර්යභාරයට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය ලබා ගැනීම පිණිස ක්ෂේත්‍රයේ ප්‍රවීණයින්ගේ සහභාගිත්වයෙන් ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම.

* කෘෂිකර්ම අංශ නවීකරණය සඳහා වූ ලේකම් කාර්යාලයක් ජනාධිපති කාර්යාලය යටතේ ස්ථාපිත කිරීම.

* කෘෂිකර්ම අංශ නවීකරණ කටයුතු ඵලදායී හා තිරසර අයුරින් මෙන්ම මනා සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් "කෘෂිකර්ම අංශ නවීකරණ සේවා සහ දැනුම් කේන්ද්‍රස්ථාන" ස්ථාපිත කිරීම.

* යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ගොවිජන සංවර්ධන පනත ඇතුළු අනෙකුත් අදාළ නීතිමය සංශෝධනයන් සිදු කිරීම.

03. **ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හා තුර්කි අභ්‍යවකාශ ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හා තුර්කි අභ්‍යවකාශ ආයතනය අතර මානව සම්පත් සංවර්ධන සහයෝගීතාව සඳහා අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා වී ඇත. එමගින්, තුර්කි අභ්‍යවකාශ ආයතනයේ අන්තර්ජාතික සීමාවාසික වැඩසටහන සඳහා පුහුණුලාභියෙකු ලෙස සහභාගී වීමට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සිසුන්ට අවස්ථාව උදා කර ගැනීම ඇතුළු ප්‍රතිලාභ රාශියක් ලබා ගැනීමට හැකි වනු ඇත. ඒ අනුව, යෝජිත අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **න්‍යෂ්ටික සහ අනෙකුත් විකිරණශීලී ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ ජාතික න්‍යෂ්ටික ආරක්ෂක පරිපාලනය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර අවබෝධතා ගිවිසුම**

න්‍යෂ්ටික සහ අනෙකුත් විකිරණශීලී ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ ජාතික න්‍යෂ්ටික ආරක්ෂක පරිපාලනය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා වී ඇත. ඒ සඳහා පිළියෙල කරනු ලැබ ඇති කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ජාතික ක්‍රමසම්පාදන

දෙපාර්තමේන්තුව යන ආයතනවල නිරීක්ෂණ සහ නීතිපතිගේ නිෂ්කාශනය ලබා ගෙන තිබේ. ඒ අනුව, යෝජිත අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **ආසිරි පෝර්ට් සිටි හොස්පිටල් (පෞද්ගලික) සමාගම ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම**

ආසිරි පෝර්ට් සිටි හොස්පිටල් (පෞද්ගලික) සමාගම විසින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 100ක ආයෝජනයක් යටතේ කොළඹ වරාය නගරයේ රෝහලක් සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 2(ආ) යටතේ එම ව්‍යාපෘතිය නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සපුරා තිබේ. ඒ අනුව, එකී විධිවිධාන යටතේ අදාළ නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම සඳහාත්, එම ව්‍යාපෘතිය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් වශයෙන් ගැසට් පත්‍රයේ නියමයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එකී නියමය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහාත්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනා ලදී.

06. **වික්රි සොෆ්ට්වෙයාර් පීවීට් ලිමිටඩ් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතියික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම**

වික්රි සොෆ්ට්වෙයාර් පෞද්ගලික සමාගම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 100,000ක ආරම්භක සෘජු විදේශ ආයෝජනයක් සහිතව තොරතුරු තාක්ෂණය පිළිබඳ ව්‍යාපාරයක් කොළඹ වරාය නගරයේ ආරම්භ කිරීම පිණිස යෝජනාවක් ඉදිරිපත් කර ඇත. 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 2(ආ) යටතේ එම ව්‍යාපෘතිය නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සපුරා තිබේ. ඒ අනුව, එකී පනතේ විධිවිධාන යටතේ අදාළ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම සඳහාත්, එම ව්‍යාපෘතිය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් වශයෙන් ගැසට් පත්‍රයේ නියමයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එකී නියමය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහාත්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **"ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු අදියර II ව්‍යාපෘතිය" සඳහා ජර්මානු ෆෙඩරල් ජනරජයේ තාක්ෂණික සහාය ලබා ගැනීම**

ශ්‍රී ලංකාවේ කාර්මික, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු අදියර II ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා 2023-2026 කාලසීමාව තුළ යුරෝ මිලියන 7ක ප්‍රදානයක් ලබා දීමට ජර්මානු ෆෙඩරල් ජනරජය විසින් එකඟතාව පළ කර ඇත. එකී ව්‍යාපෘතිය ජර්මානු ෆෙඩරල් ජනරජය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස GIZ ආයතනය කටයුතු කරනු ලබයි. යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා GIZ ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ගිවිසුමක් අත්සන් කිරීමට නියමිත අතර, කෙටුම්පත් ගිවිසුම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිරීක්ෂණ සහ නීතිපතිගේ නිෂ්කාශනය ලබා ගෙන ඇත. ඒ අනුව, යෝජිත ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ශ්‍රී ලංකාව සහ මහා බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානි රජය හා උතුරු අයර්ලන්ත රජය අතර සමුද්‍රික රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන සඳහා සහයෝගීතාව පිණිස වූ අවබෝධතා ගිවිසුම**

මහා බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානි රජය සහ උතුරු අයර්ලන්ත රජය වර්තමානයේදී සාගර සෞඛ්‍ය පිළිබඳ ගෝලීය මුල පිරීම් පිළිබඳ නායකත්වය දෙමින් සිටී. ඒ අනුව, 2030 වන විට ගෝලීය සාගරයෙන් අවම වශයෙන් 30%ක් ආරක්ෂා කර ගැනීමත්, සාගර ආරක්ෂාව සහ තිරසර නීල ආර්ථිකයක් ළඟා කර ගැනීම සඳහා යුරෝ මිලියන 500ක් වටිනා "Blue Planet" අරමුදල ස්ථාපිත කිරීමත්, හවුල්කාරිත්ව රටවල් වෙත එමඟින් අවශ්‍ය අරමුදල් ලබා දීමත් කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. එක්සත් රාජධානියේ පරිසරය, ආහාර හා ග්‍රාමීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් "Blue Planet" අරමුදලේ අභිලාෂ සාක්ෂාත් කර ගැනීම සඳහා ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික මට්ටමේ වැඩසටහන් සමූහයක් සැලසුම් කර තිබේ. එම වැඩසටහන් අතුරින් එකක් වන සමුද්‍රික රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන යටතේ සහාය ලැබීමට සුදුසු රටක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, සමුද්‍රික රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන සඳහා සහයෝගීතාව පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහා බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානි රජය හා උතුරු අයර්ලන්ත රජය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී තිබේ. ඒ සඳහා වන කෙටුම්පත්

අවබෝධතා ගිවිසුමට අදාළ අනෙකුත් අමාත්‍යාංශ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් අදහස් දැක්වීම් ලබා ගෙන ඇත. එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **මැල්සිරිපුර ගොවිපොළට අයත් අක්කර 05ක ඉඩම් කොටසක් ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා ලබා දීම**

ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් මැල්සිරිපුර ගොවිපොළෙන් අක්කර 05ක භූමි ප්‍රමාණයක් පොදු ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන ලෙසට ඉල්ලීමක් ඉදිරිපත්ව තිබේ. ඒ අනුව, එම ගොවිපොළේ මැදමුල්ල බෙදුමෙන් අක්කර 05ක ප්‍රමාණයක් වෙන් කර දීමට ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව ලැබී ඇත. එකී ඉඩම් කොටස ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම පිණිස කෘෂිකර්ම සහ වැව්ලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ශ්‍රී ලංකාව සහ රුසියානු සමූහාණ්ඩුව අතර ක්‍රීඩාවේ සහයෝගීතාව සඳහා වන අවබෝධතා ගිවිසුම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා රුසියානු සමූහාණ්ඩුව අතර ක්‍රීඩාවේ සහයෝගීතාව සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම පිණිස 2021-07-12 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එහෙත්, ඉන් අනතුරුව එකී අවබෝධතා ගිවිසුමට සංශෝධන කිහිපයක් ඉදිරිපත් කිරීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ගිවිසුම අත්සන් කිරීමට හැකි වී නොමැත. එකී සංශෝධන ඇතුළත්ව නැවත පිළියෙල කරනු ලැබ ඇති කෙටුම්පත් ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **නවසීලන්තයේ වෙලින්ටන් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයක් ස්ථාපිත කිරීම**

නවසීලන්තය සහ ශ්‍රී ලංකාව අතර පවතින රාජ්‍යතාන්ත්‍රික සබඳතා තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් නවසීලන්තයේ වෙලින්ටන් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයක් පිහිටුවීම යෝග්‍ය බවට හඳුනා ගනු ලැබ ඇති අතර, ඒ අනුව කටයුතු කිරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ත්‍රිකුණාමලය චීන වරායේ ඉහළ ටැංකි අංගනයේ ඉන්ධන ගබඩා ටැංකි 61ක් ඉදි කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම ව්‍යාපාරික මාදිලිය යටතේ සංවර්ධනය කිරීම**

ත්‍රිකුණාමලය චීන වරායේ ඉහළ ටැංකි අංගනයේ ඉන්ධන ගබඩා ටැංකි 99කින් සමන්විත වන අතර, 2022-01-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කළ පරිදි ඉන් ටැංකි 61ක් ත්‍රිකුණාමල ඛනිජතෙල් පර්යන්ත පුද්ගලික සමාගමට වසර 50ක කාලයකට බදු දීම පිණිස අනුමැතිය ලබා දී ඇත. එම තෙල් ටැංකි 61 සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම ඇතුළුව මූලික පියවර මේ වන විට ආරම්භ කර තිබේ. එම ශක්‍යතා අධ්‍යයනය මඟින් මෙම ව්‍යාපෘතිය වසර 16ක් තුළ අදියර 07ක් යටතේ සංවර්ධනය කිරීමට නිර්දේශ කර ඇති අතර, එහි පළමු අදියර යටතේ ආර්ථික වශයෙන් එලදායී ටැංකි 09ක් ප්‍රතිසංස්කරණය කිරීමටත්, ආසන්න වශයෙන් කිලෝමීටර 1.75ක දිගින් යුත් නළ මාර්ගයක් සකස් කිරීමටත්, ඊට අදාළ අනෙකුත් පහසුකම් ඉදිකිරීමටත් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOT) යන ව්‍යාපාර මාදිලිය අනුගමනය කිරීමට යෝජනා කර තිබේ. ඒ අනුව, පළමු අදියර යටතේ සිදු කිරීමට යෝජිත සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීම පිණිස අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **2022 අංක 01 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (ඉ-ග්‍රාම නිලධාරී තොරතුරු පද්ධතිය) නියෝග ක්‍රියාත්මක කිරීම**

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන යටතේ තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ඇති 2022 අංක 01 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (ඉ-ග්‍රාම නිලධාරී තොරතුරු පද්ධතිය) නියෝග 2022-12-22 දිනැති අංක 2311/40 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. එම නියෝගවලට අනුව අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන් හරහා සේවාවන් කාර්යක්ෂමව ලබා දීම සඳහා ඉලෙක්ට්‍රොනික ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිත කිරීම සඳහා පහසුකම් සලසනු ලැබේ. එකී නියෝග අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **වනාන්තර ප්‍රතිරෝපණය සහ වෘක්ෂ ආවරණ පනත් කෙටුම්පත සකස් කිරීම**

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය යටතේ, වසර 2030 වන විට ශ්‍රී ලංකාවේ වනාන්තර ආවරණය මුළු භූමි ප්‍රමාණයෙන් 32%ක් දක්වා ඉහළ නැංවීමටත්, වනාන්තර මගින් අවශෝෂණය කර තබා ගන්නා කාබන් ප්‍රමාණය වර්තමාන තත්ත්වයට වඩා 7%කින් ඉහළ නැංවීමටත් ශ්‍රී ලංකාව එකඟතාව පළ කර ඇත. ඒ සඳහා වන වගා කිරීම, හායනයට පත් වූ වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම, වනාන්තරයෙන් බාහිරව ඇති රජයේ සහ පුද්ගලික ඉඩම්වල තුරු ආවරණය ඉහළ නැංවීම මේ වනවිට සිදු කරමින් පවතී. මෙම රුක් රෝපණ වැඩසටහන් විවිධ පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරනු ලබන අතර, ඒවායේ ප්‍රතිලාභ සමස්ත ජාතියටම අත් වුවද, ඒ සඳහා සහභාගි වන පිරිස් දිරිගැන්වීම සඳහා රුක් රෝපණයේ ප්‍රතිලාභ ඊට දායක වූ සියලු පාර්ශ්ව අතර බෙදා දීම යෝග්‍ය බවට හඳුනාගනු ලැබ ඇත. පොදු ස්ථානවල රුක් රෝපණය මගින් ලැබෙන ගෙඩි, කොළ, මල්, දැව, රෙසින් ආදී නිෂ්පාදන රුක් රෝෂණයට දායක වූ පාර්ශ්වකරුවන්ට ලබා දීම සඳහා නෛතික ප්‍රතිපාදන දැනට නොමැත. එසේම, රුක් රෝපණ කටයුතු වඩාත් ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමට පුද්ගලික අංශයේ, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධානවල සහයෝගය ලබා ගැනීම පිණිස ජාතික රුක් රෝපණ අරමුදලක් ස්ථාපිත කිරීමේ යෝග්‍යතාව ද හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, එකී කාර්යයන් සඳහා අදාළ විධිවිධාන ඇතුළත්ව "වනාන්තර ප්‍රතිරෝපණය සහ වෘක්ෂ ආවරණ පනත" යනුවෙන් නව පනතක් හඳුන්වා දීම පිණිස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **ජාත්‍යන්තර A2P (Application-to-Person) කෙටි පණිවුඩ සේවා ඩිජිටල් මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම**

A2P යනු සන්නිවේදන ආකෘතියක් වන අතර සාමාන්‍ය පුද්ගලයන් හෝ අවසාන පරිශීලකයින් වෙත පණිවුඩ හෝ දැනුම් දීම් යොමු කරන පරිගණක වැඩසටහනක් හෝ මෘදුකාංගයක් වැනි යෙදවුමකි. කෙටි පණිවුඩ සේවා (SMS) ක්‍රමය පුරවැසියන්, ව්‍යාපාර සහ රජයේ ආයතන සඳහා වන තීරණාත්මක සන්නිවේදන මාධ්‍යයක් ලෙස ව්‍යාපාර හා ගනුදෙනු පිළිබඳ ඇඟයීම් ඇතුළු විවිධ අරමුණු සඳහා බහුලව භාවිතා වේ. මෙම පණිවුඩ, කෙටි පණිවුඩ (SMS), බහුමාධ්‍ය පණිවුඩ (MMS) හෝ වෙනත් ආකාරයක පණිවුඩ ලෙස යැවීම යනාදී වශයෙන් පුද්ගලයෙකු ජංගම උපාංගයක් වෙත යෙදවුමක් හෝ පද්ධතියක් හරහා බෙදා හරිනු

ලැබේ. කෙටි පණිවුඩ සේවා පුළුල් ලෙස භාවිත කිරීම මඟින් වංචා, අයාචිත (Spam) සහ අනවසර ක්‍රියාකාරකම් සිදු වන බව නිරීක්ෂණය වී තිබේ. එබැනි අභියෝගවලට මුහුණ දීම පිණිස කෙටි පණිවුඩ හුවමාරුවීම් නියාමනය සඳහා මධ්‍යගත කෙටි පණිවුඩ සේවා ජාලා ආරක්ෂණ උපාංග (SMS Firewall) විසඳුමක් පැවතීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, එක්සත් රාජධානිය පදනම් කර ගත් පෞද්ගලික සමාගමක් වන Infobip ආයතනය විසින් ජාත්‍යන්තර A2P කෙටි පණිවුඩ සේවා මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර එකී යෝජනාව ඇගයීමට ලක් කර නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, තාක්ෂණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********